# ජෙයරාජ් ජ වි පෙ හා ජාතිකත්වය

පසුගිය සතියේ දේශපාලන ලෝකයේ ප්‍රධාන සිදුවීම් දෙකක් සිදුවිය. එකක් කොටි ත්‍රස්තවාදීන් විසින් ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා ඝාතනය කරනු ලැබීම ය. දෙවැන්න ජ වි පෙ වෙනත් කසිකබල් මාක්ස්වාදී පක්ෂ ගිය මගේ ම ගොස් අනුර බණ්ඩාරනායක මහතාගේ වචනවලින් කිවහොත් ත්‍රිරෝද පක්ෂයක් බවට පත්වීමට ගෙන ඇති තීරණය හෙළිදරවු වීම ය. මේ තීරණය ගැනීම ඇරඹුණේ පළාත් පාලන ආයතන සඳහා පැවැත්වූ පසුගිය මැතිවරණයෙන් පසුව යැයි කිව හැකි ය. එවැනි මගක යෑමට විරුද්ධව දිගින් දිගට ම කටයුතු කළ විමල් වීරවංශ මහතා පසුගිය විසිඑක් වැනි සිකුරාදා පක්ෂයෙන් නෙරපීමට තීරණය කර ඇති බව කියැවෙයි. මෙයින් කියැවෙන්නේ ඒ මහතා සවිඥානික ව එවැනි මගක යෑමට විරුද්ධව කටයුතු කළ බව නොව දැනුවත් ව හෝ නොදැනුවත් ව හෝ ජාතිකත්වය මත පදනම් ව ක්‍රියාකිරීමෙන් ජ වි පෙ මෙරට දේශපාලනයෙහි තීරණාත්මක පක්ෂයක් බවට පත්කිරීමට උත්සාහ ගත් බව ය. එහෙත් පක්ෂයෙහි ජාතිකත්වයට විරුද්ධ විජාතික බලවේග කසිකබල් මාක්ස්වාදී මත පුනරුච්චාරණය කරමින් ඒ මහතා පක්ෂයෙන් නෙරපා දමා ඇත.

ප්‍රනාන්දුපුල්ලේ මහතා සිංහල බෞද්ධයෙක් නො වී ය. එහෙත් ඒ මහතා මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය විශේෂ තැනක් ගන්නා බව පිළිගත්තේ ය. අද එ ජා පක්ෂයේ ඇතැම් කතෝලික හා ක්‍රිස්තියානි මන්ත්‍රීවරු රජමහා විහාරවල ප්‍රධාන දායකයෝ වෙති. තවත් අය පන්සල් ආශ්‍රය කරමින් මඩු පල්ලියට ආණ්ඩුව පහර දුන්නේ යැයි මර ලතෝනි දෙමින් කොටි සුසාන භූමිවලට ගොස් කොටි ත්‍රස්තවාදීන්ට ගරුකරති. ඔවුන්ගේ දායකකම් ඡන්දය ලබාගැනීමට පමණක් බවත් ඔවුන් විජාතික බලවේග නියෝජනය කරන බවත් ජාතිකත්වයට විරුද්ධ බවත් පැහැදිළි ය. ඔවුහු කොටි පරාජයකරන ලෙස නො ඉල්ලති. නිතර නෝර්වේ ආදී රටවලට යන ඔවුහු ජෙයරාජ් ඝාතනයෙන් පසු ද සාකච්ඡා මාර්ගයට පිවිසෙන්නැයි ආණ්ඩුවට උපදෙස් දෙන්නේ ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව අනුකරණයකරමිනි.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා ප්‍රසිද්ධියේ ම කොටි පරාජයකිරීම වෙනුවෙන් පෙනී සිටියේ ය. ඇතැම් කතෝලික නායක පූජකවරුන් සිටියේ කාගේ පැත්තේ ද යන්න ගැන ඒ මහතාට අවබෝධයක් විය. මඩු පල්ලිය අවට කොටින්ට ජීවත්වීමට අවසර දෙමින් ඒ ප්‍රදේශවලින් කොටි පැන්නීමට හමුදාව මෙහෙයුම් දියත්කරන විට පමණක් මඩු පල්ලිය අවට ඊනියා යුද්ධය නැති කලාපයක් බවට පත්කිරීමට උද්ඝෝෂණය කරන ඇතැම් නායක පූජකයන් ගැන ඒ මහතා දැන සිටියේ ය. මඩු මාතා පිළිමය කොටින්ගේ යුද සුරුවමක් කරමින් එය මඩු පල්ලියෙන් තවත් උතුරට කොටි සිටින ප්‍රදේශයකට ගෙනගිය පූජකවරුන් සිංහල කතෝලිකයන්ට ඒ පිළිමය දැක බලාගැනීමටවත් ඉඩක් නොදෙන්නේ විජාතික බලවේගවල අවශ්‍යතාවට ය . කතෝලික නායක පූජකවරුන් අද සිංහල කතෝලිකයන් එඬේරකු නොමැති බැටළුවන් බවට පත්කර ඇත. මේ පූජකවරුන්ට අවශ්‍යතාවක් තිබිණි නම් ආණ්ඩුව හා හමුදාව සමග සාකච්ඡාකර පිළිමය මඩු පල්ලියෙන් දකුණට ගෙන ඒමට තිබුණි. එසේ කෙළේ නම් සිංහල දෙමළ සියළු කතෝලිකයන්ට ඉන් යහපතක් වනු නොඅනුමාන ය. එහෙත් දැන් මඩු මාතා පිළිමය ඇත්තේ කොටින්ගේ අණසක යටතෙහි ය. දෙමළ බිෂොප්වරුන් බොහෝ දෙනකු ඇතුළු ඇතැම් කතෝලික නායක පූජකවරුන් දෙමළ ජාතිවාදයට හා කොටි ත්‍රස්තවාදීන්ට ආශිර්වාද කරන්නේ ඔවුන් මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන දීමට විරුද්ධ බැවිනි.

මෙරට ප්‍රශ්නය අන්කිසිවක් නොව සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන නොදීම බව අප පුන පුනා කියා ඇත. ඕනෑම රටක ඓතිහාසික ව හෝ වෙනත් කරුණු මත හෝ තීරණය වූ ප්‍රධාන සංස්කෘතියක් වෙයි. බටහිර රටවල ප්‍රධාන සංස්කෘති වෙයි. එංගලන්තයේ ඉංගිරිසි ඇංග්ලිකන් සංස්කෘතිය ප්‍රධාන සංස්කෘතිය වෙයි. බහු සංස්කෘතික රටවල් යන්න ක්‍රිස්තියානි නොවන රටවල විශේෂිත සංස්කෘතීන් නැතිකිරීම සඳහා බටහිර උගතුන් විසින් නිර්මාණයකෙරී ඇති ව්‍යාජ සංකල්පයකි. එංගලන්තය ඕස්ට්‍රේලියාව ඇමරිකාව ආදී රටවල විවිධ සංස්කෘතිවල ජනයා ඇති නමුත් එහි ප්‍රධාන සංස්කෘතිය ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙයි. ඒ රටවල බහු සංස්කෘතික යන්න යෙදෙන්නේ ප්‍රධාන සංස්කෘතියක් සහිතව තවත් සංස්කෘති ඇත යන අර්ථයෙනි. එහෙත් ලංකාව ආදී රටවල ඒ සංකල්පය යෙදෙන්නේ එක ම සංස්කෘතියකටවත් ප්‍රධානකමක් තබා විශේෂත්වයක්වත් නැත යන අර්ථයෙනි. සංස්කෘතික යටත්විජිතවාදය මෙහි දී ක්‍රියාත්මක වී යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හැරෙන්නට අනෙක් සංස්කෘතීන් දුර්වලකිරීමට කටයුතුකෙරෙයි.

© Prof. Nalin De Silva

ඇතැම් නායක පූජකයන් කෙසේ වෙතත් සාමාන්‍ය සිංහල කතෝලිකයෝ සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට විශේෂිත සංස්කෘතිය බව පිළිගනිති. එසේ පිළිගැනීමෙන් තමන් දෙවැනි පංතියේ පුරවැසියන් නොවන බව ද ඔවුහු දනිති. පුද්ගලයන් දෙදෙනකු සමානකිරීම හා සංස්කෘති දෙකක් සමානකිරීම යනු එකක් නොව දෙකක් බව ඔවුහු අත්දැකීමෙන් දනිති. එහෙත් නායක පූජකයන්ට මෙන් ම මාක්ස්වාදීන්ට ද වෙන ම න්‍යාය පත්‍රයක් ඇත. ඔවුන්ගේ සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙයි. ඔවුන් බහු සංස්කෘතික යන්නෙන් අදහස්කරන්නේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ප්‍රධානත්වයෙන් අනෙක් සංස්කෘතීන් පැවතීම ය. හැකිනම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පමණක් පැවතීම ය. කාල් මාක්ස් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අංක එකේ සාමාජිකයෙක් විය.

අද ඇතැමුන් ලංකාව හඳුන්වන්නේ සිංහල බෞද්ධ ආධිපත්‍යයක් ඇති,  සිංහල බෞද්ධ නොවන අයකුට අගමැති හෝ ජනාධිපති හෝ වීමට නොහැකි රටක් ලෙස ය. ඉන්දියාවේ නම් සික් ජනවර්ගයට අයත්වූවකුට ද අගමැති විය හැකියැයි ඔවුහු පෙන්වා දෙති. ඉන්දියාව වාචික ව අනාගමික සංස්කෘතියක් ගැන කතාකළ ද එය හින්දු රටකි. එහි විශේෂිත සංස්කෘතිය හින්දු බව සික්වරු ද අනෙක් අය ද පිළිගනිති. එබැවින් සික් ජනවාර්ගිකයකුට එහි අගමැති විය හැකි ය. එහෙත් ලංකාවේ විශේෂිත සංස්කෘතිය සිංහල බෞද්ධ බව පිළිගන්නා දේශපාලනඥයෝ කවරහු ද? එවැන්නන් වැඩි පිරිසක් දැකගත හැක්කේ ශ්‍රී ල නි පක්ෂයෙහි ය. මහජන එක්සත් පෙරමුණේ හා ජාතික හෙළ උරුමයේ ද එවැන්නෝ වෙති. එහෙත් ජ වි පෙරමුණ පක්ෂයක් ලෙස සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂත්වයක් නොපිළිගන්නවා පමණක් නොව එහි බොහෝ නායකයෝ ද ඒ බව නො පිළිගනිති. විමල් වීරවංශ මහතා ඒ බව පිළිගන්නේ දැයි මම නො දනිමි. එහෙත් ඒ මහතාගේ දේශපාලනයෙහි ඒ බව දැක ගන්නට හැකිවිය. ජ වි පෙරමුණෙහි අනෙක් බොහෝ නායකයෝ කසිකබල් මාක්ස්වාදයට එකඟ ව ඒ බව නො පිළිගනිති. මාක්ස්වාදයෙහි කසිකබල් බව නොපිළිගන්නා අයකු වේ නම් මාක්ස්වාදයේ දරිද්‍රතාවයට හා අපෝහකයේ රූපිකයට පිළිතුරක් ලියන මෙන් අභියෝගකරමි. පළමු පොත ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.කාලය.ඕර්ග් වෙබ් අඩවියේ නොමිළයේ කියවිය හැකි ය.

ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා ඡන්දය ගැනීමට නොව අවංකව ම මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂත්වය පිළිගත්තේ ය. විලෝම ව එවැනි සිංහල බෞද්ධ නොවන පුද්ගලයන්ට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂිත තැනක් හිමිවෙයි. ලක්ෂමන් කදිරගාමර් මහතා ද සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විශේෂිතබව පිළිගත් සිංහල බෞද්ධ නොවූ දේශපාලනඥයෙකි. මේ දෙදෙනා ම මෙරට අගමැතිවරු ලෙස පිළිගැනීමට තිබුණි. විජාතික බලවේගවලට එය දරාගත නොහැකි කරුණක් විය. ඒ දෙදෙනා ම කොටි ත්‍රස්තවාදීන් විසින් ඝාතනයකරනු ලැබීම පුදුමයක් නො වෙයි.

විමල් වීරවංශ මහතා දේශපාලන වශයෙන් ඝාතනය කෙරිණි යැයි මම නො කියමි. ඉගෙන ගැනීමට සූදානම් ඒ මහතාගේ දේශපාලන හදවත තවමත් ක්‍රියාකරයි. එහෙත් ජ වි පෙ නම් සමසමාජ කොමියුනිස්ට් පක්ෂ ගිය මගේ යෑම අරඹා ඇත. ඒ පක්ෂය ද පනස්හයේ දරුවන්ගෙන් සමන්විත නමුත්, පක්ෂ හදවතෙහි සිංහල බෞද්ධකමක් ඇති නමුත් මොළයෙහි ඇත්තේ පුස් කෑ මාක්ස්වාදය ය. මාඕවාදී ජන්මයක් සහිත ඒ පක්ෂය පසුගිය අවුරුදු හතළිහ පුරා ම හදවත හා මොළය අතර දෝලනය විය. පක්ෂය මාක්ස්වාදයෙන් කැඩී ජාතිකත්වය වෙතට නැඹුරුවීම වෙනුවට දැන් අනෙක් පැත්තට ගමන්කරන්නේ තීරණාත්මක මොහොතක ය. මේ මොහොතේ මේ මගෙහි දිගට ම ගියහොත් ආපසු ඒමක්, දෝලනයක් නැත. පළාත් පාලන ආයතන මැතිවරණය වන තෙක් ජාතිකත්ව හදවතින් පාලනය වූ පක්ෂය එහි දී ලැබූ පරාජයත් සමග මාක්ස්වාදී මොළය වෙත හැරී ඇත. පක්ෂයෙහි වැඩි බලය ඇත්තේ ජාතිකත්වයට නොව මාක්ස්වාදයට ය. ජ වි පෙ ට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ඇත්තේ ජාතිකත්වය ඔස්සේ ය. පළාත් පාලන මැතිවරණ පරාජයෙන් පසු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයෙන් හා ශ්‍රී ල නි පක්ෂයෙන් ඈත්වීමට මොළයෙන් බලකෙරී ඇත. ඔවුන්ට මාක්ස්වාදය ඔස්සේ ඇත්තේ අවිගත් දේශපාලනයකි. තමන්ට ආයුධ නැත්නම් ඔවුන් ඇතැම්විට ආයුධ ඇති තැන් ගැන සිතනු ඇත. විමල් වීරවංශ මහතා එලෙස කල්පනා නොකළ ද මාක්ස්වාදය ද විජාතික බලවේගයකි. ඒ මහතාට එරෙහිව අද පක්ෂයෙහි ක්‍රියාකරන ප්‍රධාන විජාතික බලවේගය මාක්ස්වාදය ය. ඒ මහතාට ඇතුළතින් එන වෙඩි පහර මාක්ස්වාදයෙන් එන එකකි. අද ජාතිකත්වයට එරෙහිව මාක්ස්වාදය හා ධනේශ්වර ලිබරල්වාදය අත්වැල් බැඳගෙන ඇති බැවින් ඒ වෙඩි පහර එල්ල කරන්නවුන් එ ජා ප නියෝජිතයන් පමණක් ලෙස විමල් වීරවංශ මහතා තවම දකියි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva